සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11ශ්‍රේණිය	දෙවන වාර පරීක්ෂණය - 2024 ක්‍රිස්තියානි ධර්මය	15 S I,II

නම: ..... **I පත්‍රය** **කාලය පැය තුනයි**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ඊශ්‍රායෙල් හි අධිපතීත්වය දැරීමට පැමිණෙන තැනැත්වහන්සේගේ උපත පිළිබඳව දිවැස්වැකි ප්‍රකාශ කරන ලද දිවැසිවරයා වන්නේ,
1. යෙසායා ය. 2. මීකා ය. 3. ජෙරමියා ය. 4. මලාකි ය.

02. "බොහෝ දෙනා ඔහුගේ උත්පත්තිය වෙතුවෙන් ප්‍රීති වන්නාහ. මන්ද ඔහු ස්වාමීන් වහන්සේ අභිමුවේ හි ශ්‍රේෂ්ඨ වන්නේ ය" ලෙස ප්‍රකාශ කරන ලද්දේ,
1. ගාබ්‍රියෙල් දේවදූතයා විසින් මරියතුමියටය. 2. දෙවියන් වහන්සේ විසින් මරියතුමියටය.
3. ගාබ්‍රියෙල් දේවදූතා විසින් සෙකරියස්ටය. 4. දෙවියන් වහන්සේගේ දූතයෙක් විසින් සෙකරියස්ටය.

03. මතෙව් සුබසුනට අනුව ජේසු උපතේ විශේෂත්වය සනිටුහන් කෙරෙන සංසිද්ධීන් ඇතුළත් වරණය තෝරන්න.
A - රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළින්දා B - එඬේරුන්ගේ හා දේවදූතයන්ගේ පැමිණීම
C - අහසේ පායන ලද සුවිශේෂී තාරකාව
D - ශාස්ත්‍රවන්තයන් විසින් පුදන ලද රන්, තුවරලා හා ගන්ධරස
1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. C හා D ය.

04. අන්‍ය ජාතීන් හා මිශ්‍රවීම නිසා අපවිත්‍ර වූ ජන කොටසක් ලෙස සළකා පිළිකුල් කර ප්‍රතික්ෂේප කරන ලද ජන කණ්ඩායමක් වන්නේ,
1. පරිසිවරුන් ය. 2. ලියන්නන් ය. 3. සද්දුසිවරුන් ය. 4. සමාරිතයන් ය.

05. තමන් සතු සියලු දේ නැති වුවත් දෙවිදුන් කෙරෙහි දැඩි විශ්වාසයෙන් සිටි තැනැත්තා වන්නේ,
1. ජෝබ් ය. 2. මෝසෙස් ය. 3. දාවිත් ය. 4. යෙසායා ය.

06. දේව රාජ්‍යයේ වර්ධනය අභිරහසාත්මකව සිදුවන බව පෙන්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමාවකි.
1. වපුරන්නාගේ උපමාව 2. මුහුන් පිළිබඳ උපමාව
3. අඹ ඇටයේ උපමාව 4. නැති වූ බැටළුවා පිළිබඳ උපමාව


07. "බිය නොවන්න ඇදහිල්ලෙන්ම සිටින්න" ඉහත ප්‍රකාශනය හා සම්බන්ධ පුද්ගලයන් වන්නේ,
1. ජේසුස් වහන්සේ හා වැන්දඹු ස්ත්‍රී ය. 2. ජේසුස් වහන්සේ හා අනනියස් ය.
3. ජේසුස් වහන්සේ හා සෙකරියස් ය. 4. ජේසුස් වහන්සේ හා යායිරස් ය.

08. ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් වලදී උපමා රූපකයන් ලෙස ලුණු යොදාගත්තේ,
1. වෑංජන රසවත් කිරීමට ලුණු අත්‍යාවශ්‍යය.
2. ලුණු දියවෙන සුළු නිසාය.
3. කිතුණු ජීවිත රසයෙන් තොර වුවහොත් දේව රාජ්‍යයේ පුරවැසිකම් ඵලදායී නොවන නිසාය.
4. අපගේ ජීවිතවලට ලුණු අත්‍යාවශ්‍ය නිසාය.

09. යුදා ආගමික නීතිය අනුව චෝදනා විභාග කර තීන්දුව දෙනු ලැබුවේ,
1. පිලාත් ආණ්ඩුකාරයා විසිනි 2. යුදෙව් රජු විසිනි
3. නායක පූජකයන් විසිනි 4. යුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි.

10. දේව කැමැත්තට කීකරු වෙමින් ජේසුස් වහන්සේ ප්‍රබල ලෙස යාච්ඤා කළේ
1. ගෝලයන් තෝරා ගැනීමට ප්‍රථමයෙන් ය. 2. කන්ද උඩ දේශනයේ දී ය.
3. ගෙත්සෙමන උයනේ දී ය. 4. පරීක්ෂාවන් ජය ගැනීමට ප්‍රථමයෙන් ය.

11. සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්නැයි" ජේසුස් වහන්සේ වදාළ සේක. මෙසේ වදාළේ,
1. සද්දුසිවරුන්ට ය. 2. පරිසිවරුන්ට ය. 3. අයකැමියන්ට ය. 4. විනයදරයන්ට ය.

12. 

වෘත්ත සටහනේ සඳහන් ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් අතුරින් සර්ජනාවේ පුත්‍රයන් ලෙස හඳුන්වන්නේ

1. A හා B ය. 2. A හා D ය.
3. B හා C ය. 4. A හා C ය.

13. ජුදෙව් ජනතාව බලාපොරොත්තුවෙන් සිටි ක්‍රිස්තුස් නම් ගැළවුම් කාරයාණන්ගේ සම්ප්‍රාප්තිය සිදුවන බවට දිවැසිවරුන් විසින් ප්‍රකාශ කර සිටියේ,

1. ජෙරුසෙලම් නුවරදී ය. 2. නාසරෙත් නුවරදී ය. 3. ජුදා නුවරදී ය. 4. දාවිත්ගේ නුවරදීය.

14. "එතුමාණෙනි ..... ද ..... ද රජකම් කරන සේක" ඉහත ප්‍රකාශනයේ හිස්තැනට ගැළපෙන දේව රාජ්‍යයේ වටිනාකම් වන්නේ,

1. සාමය හා සාධාරණත්වය ය. 2. නිහතමානීකම හා ධර්මිෂ්ට බව ය.
3. යුක්තිය හා ධර්මිෂ්ඨතාවය ය. 4. නිහතමානීකම හා කීකරුකම ය.

15. ආබ්‍රහම්ගේ දියණිය ලෙස ජේසුස් වහන්සේ සෙනඟට හඳුන්වා දුන්නේ,

1. කුඳු ස්ත්‍රිය ය. 2. සමාරිය ස්ත්‍රිය ය. 3. මහලේ රෝගී ස්ත්‍රිය ය. 4. වැන්දඹු ස්ත්‍රිය ය.

16. දේව මාළිගා බද්ද ගෙවීම සඳහා ජුදෙව්වන් භාවිතා කළේ,

1. රිදී කාසිය. 2. තඹ කාසිය 3. දිනාර් කාසිය 4. රෝම කාසිය.

17. ස්නාවක ජොහාන්තුමා මනස්ථාපනයේ බෞතීස්මය ලබාදෙමින් බොහෝ දෙනෙකු

1. ස්වාමීන් වහන්සේ වෙත හරවනු ලැබුවේ ය. 2. පාපයෙන් ගළවාගනු ලැබුවේ ය.
3. මනස්ථාපනය කළ සේක. 4. තමන් වෙත කැඳවාගත් සේක.

18. ජීවිතයේ අවසන් මොහොතේ වුවද පිළිගෙන පසුතැවිලි වී කමාව ලබන්නා

1. පව් සමාව ලබාගනියි. 2. දේව පුත්‍රකම ලබයි.
3. සදාතනික ජීවනය උරුමකර ගනියි. 4. වරද පිළිගනියි.

19.

A-පීඩිතයන්	B-අන්ධයන්	C-අයකැමියන්	D-වහල්ලුන්	E-කාන්තාවන්	F-දිළින්දන්

නාසරිය ප්‍රකාශනයට අනුව, ඉහත කණ්ඩායම් අතුරින් ජේසුස් වහන්සේගේ අවධානයට යොමු වූ කණ්ඩායම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ABE හා F ය. 2. ACD හා E ය. 3. ABD හා F ය. 4. ABE හා F ය.

20. ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය පිළිබඳ ශුභාරංචිය උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට

1. නව අත්දැකීමක් ගෙන දෙන්නක් විය. 2.නව බලාපොරොත්තුවක් ගෙන දෙන්නක් විය.
3. නව මාවතකට යොමුවන්නක් විය. 4. නව සමාජයකට යොමුවන්නක් විය.

21. "දාවිත්ගේ පුත්‍රයාණෙනි මට අනුකම්පා කළ මැනවැයි" කියමින් ජේසුස් වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව තැබුවේ,

1. ජෙරිකෝවේ සිටි අන්ධ මිනිසා ය. 2. සමාරියේ සිටි ලාදුරු රෝගියා ය.
3. නාසරෙත් හි සිටි අංශභාග රෝගියා ය. 4. ගලීලයේ සිටි කුෂ්ඨ රෝගියා ය.

22. "දෙවියන් වහන්සේගේ රාජ්‍යයේහි දී ආහාර වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකැයි" පරිසිවරයාගේ ප්‍රකාශයට පිළිතුරු ලෙස ජේසුස් වහන්සේ වදාළේ,

1. යහපත් සමාරිතයාගේ උපමාවය. 2. පරිසියා සහ අයකැමියා පිළිබඳ උපමාවය.
3. මහා මංගල භෝජනය පිළිබඳ උපමාවය. 4. වපුරන්නාගේ උපමාවය.

23. ලොවපුරා ඇතිවන වසංගතයන් පිළිබඳ දිවැස්වැකි ප්‍රකාශ කළේ,

1. කොරන්ලියස් ය. 2. අන්නා ය. 3. සිමියොන් ය. 4. අගබස් ය.

24. ජෙරුසෙලමේ සහ සිලෝවම් හි වැසියන්ට වූ විපත් ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,

1. ඔවුන්ගේ පව්වලට දඬුවමක් ලෙසය. 2. දෙමව්පියන්ගේ පව්වලට දඬුවමක් ලෙසය.
3. ඔවුන්ගේ පෙර ආත්ම පව් පලදීමක් ලෙසය. 4. ජීවතුන් අතර සිටින්නන්ට අනතුරු ඇඟවීමක් ලෙසය.

25. ආබ්‍රහම්තුමා දේව කැඳවීමට දැක්වූ ප්‍රතිචාරය තුළින් තහවුරු වන්නේ

1. දෙවියන් වහන්සේ කෙරෙහි ආබ්‍රහම් තුමා තුළ පැවති ඒකාන්ත ඇදහිල්ලයි.
2. දෙවියන් වහන්සේ කෙරෙහි ආබ්‍රහම් තුළ පැවති බලාපොරොත්තුවයි.
3. දෙවියන් වහන්සේ කෙරෙහි ආබ්‍රහම් තුමා තුළ පැවති විනයගරුක බවයි.
4. ආබ්‍රහම් දෙවියන් වහන්සේ කෙරෙහි දැක්වූ ත්‍යාගවන්ත බවයි.

26. මෙසියස් වහන්සේ පිහිටුවන්නා වූ රාජ්‍ය තුළ සාමයට කෙළවරක් නොවන බව ප්‍රකාශ කරනු ලැබුවේ,
1. මීකා දිවැසිවරයා ය. 2. යෙසායා දිවැසිවරයා ය. 3. ආමොස් දිවැසිවරයා ය. 4. මලාකි දිවැසිවරයා ය.

27. "උන් වහන්සේ අපේ දුබලකම් දරාගත් සේක. අපගේ රෝග දුක්බර උසුලාගත් සේක" මෙම උපුටනයෙන් ප්‍රකාශ වන්නේ,
1. දුක් උසුලන එඬේරාණන් පිළිබඳවය. 2. මෙසියස් නම් ආලේපලත් තැනැත්තා පිළිබඳවය.
3. දුක් උසුලන මෙසායා පිළිබඳවය. 4. දුක් උසුලන සේවකයාණන් පිළිබඳවය.

28. ප්‍රේමයේ පදනම මත ක්‍රිස්තුස් වහන්සේ තුළ ස්ථිරව පවතින්නට අවශ්‍ය වනුයේ,
1. විශ්වාසය යි. 2. ඇදහිල්ල යි. 3. ප්‍රේමය යි. 4. කැපවීම යි.

29. "කිසිවෙක් තමාට ස්වාමියාණෝ කියා නොගන්න. නායකයා සේවකයා විය යුතුය." යන්න තම සේවයේ පදනම කරගනිමින් දේවස්ථාන මෙහෙවරෙන් ඔබබිට ගොස් සේවය කළේ,
1. ගරු තිස්ස බාලසූරිය පියතුමා ය. 2. ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා ය.
3. ගරු පීටර් ජෙරාඩ්ද සිල්වා පියතුමා ය. 4. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය.

30. කමාව පිළිබඳ ඉගැන්වීම තුළින් ද, ඉගැන්වීමට සීමා නොවී එය ක්‍රියාවෙන් ද, ජීවිත පූජාවෙන් ද ප්‍රත්‍යක්ෂ කළේ,
1. පේදුරුතුමා ය. 2. පාවුල්තුමා ය. 3. ජේසුස් වහන්සේ ය. 4. ස්තේපන් ය.

31. ජේසුස් වහන්සේ හා ඒකාබද්ධ වීමට යමෙකුට නොහැකි නම් නියම කිතුණුවෙක් ලෙස දිවි ගෙවීමට නොහැකි බව ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේ වදාළ උපමාවක් වන්නේ,
1. බැටළුගාල පිළිබඳ උපමාව ය. 2. මිදිවැල පිළිබඳ උපමාව ය.
3. අත්තික්කා ගස පිළිබඳ උපමාව ය. 4. අඹ ඇටයේ උපමාව ය.

32. කිතුණුවන් ලෙස අප හට තාවකාලික බලාපොරොත්තු නොව ස්ථිර බලාපොරොත්තුවක් ඇත. සදාතන ජීවිතය නමැති බලාපොරොත්තුව ඉටුකර ගැනීමට,
1. පෞද්ගලික බලාපොරොත්තු ඉටුකරගත යුතුවේ. 2. තමකම ඉස්මතු කරගනිමින් කැපවිය යුතුවේ.
3. සාමූහිකව ක්‍රියාකළ යුතුවේ. 4. තමකම ඉවත දා දේව කැමැත්ත ඉටුකළ යුතුවේ.

33. මුල් කිතුණු සභාව තමා සතු දේපළ හා වස්තුව සම්බන්ධයෙන් අනුගමනය කළ නව ක්‍රමය තුළින්,
1. බෙදා ගැනීම ඉස්මතු කළහ. 2. අධ්‍යාත්මික ජීවිතයකට මුල පිරුහ.
3. සුබසාධක සේවයට නව අරුතක් එක් කළහ. 4. ධර්ම දානයට මුල පිරුහ.

34. ජේසුස් වහන්සේ තෙවරක්ම නාදුනන බව පැවසුවත්, ජේසුස් වහන්සේට බොහෝ සේ ප්‍රේම කරන බව දැන සිටි ගෝලයා වනුයේ,
1. පාවුල් ය. 2. පේදුරු ය. 3. ලාසරස් ය. 4. ජොහාන් ය.

35. "රන්වත් රිදීවත් මට නැත එහෙත් මට ඇති දේ ඔබට දෙමි" යනුවෙන් පවසා සුවය ලබා දුන්නේ,
1. අන්ධ මිනිසාටය. 2. අතක් පණ නැති මිනිසාටය.
3. දිය උදර රෝගියාටය. 4. කොරව සිටි තැනැත්තාටය.

36. දන් දීමේ නිරතව නොකඩවා දෙවියන් වහන්සේට යාච්ඤා කළ ජුදෙව් නොවූ ගෞරවාන්විත තැනැත්තා වනුයේ,
1. කොරනේලියස් ය. 2. පාවුල් ය. 3. සිමියොන් ය. 4. අන්නාය.

37. දමස්කයට යන ගමනේ දී අන්ධ වී සිටි පාවුල්ට පෙනීම ලබා දුන්නේ,
1. යායිරස්ය. 2. කොරනේලියස් ය. 3. කයාපස් ය. 4. අනනියස් ය.

38. පළමුවරට ක්‍රිස්තියානි යන නාමය ශ්‍රාවකයන්ට දෙනු ලැබුයේ,
1. ජෙරුසලම් සභාවේ දී ය. 2. අන්තියෝකයේ සභාවේදී ය.
3. මන්ත්‍රණ සභාවේ දී ය. 4. එපීසසීය සභාවේ දී ය.

39. A- සීලස්, B- ජොහාන්මාක් , C-තිමෝතියස් , D-ත්‍රොපිමස්
දෙවන ධර්ම දූත ගමන සඳහා එක් වූවන් වන්නේ,
1. AB ය. 2. BD ය. 3.CD ය. 4. AC ය.

40. තෙවන ධර්මදූත ගමනේ දී පාවුල් තුමා හා පිරිස අපට පසක් කර දෙන්නා වූ ධර්මතාවක් වන්නේ,
1. මිත්‍යා රූප වන්දනාවෙන් මිනිසුන් වළකා ගැනීමේ අභියෝගය.
2. ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීමේ අභියෝගයයි.
3. තම අත්දැකීම් සේවය සඳහා යොදාගැනීමේ අභියෝගයයි.
4. පීඩාවන් හමුවේ අධෛර්යට පත්නොවී ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ සේවය කළ යුතුබවයි.

(1x 4 = 40)

II පත්‍රය

• පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. ජේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳවූ ස්ථානය හඳුන්වන නම් 2 ක් ලියන්න.
ii. ජේසු බිළිදා කැප කිරීම සඳහා දේව මාලිගයට රැගෙන යන අවස්ථාවේ එහි සිටි පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.
iii. ජේසුස් වහන්සේ ළමා කාලයේ ගලීලයේ නාසරෙත් නුවර හැදුණ වැඩුණ ආකාර 2 ක් ලියන්න.
iv. යුදා පිරිමි දරුවන් වෙනුවෙන් ඉටු කරනු ලැබූ චාරිත්‍ර 2 ක් ලියන්න.
v. මරියතුමිය තම ඥාති සොයුරිය වූ එළිසබෙත් බැහැදුකීමට පැමිණි අවස්ථාවේ ඇය ශුද්ධාත්මයෙන් පූර්ණව කළ ප්‍රකාශනයේ ඇතුළත් කරුණු 2 ක් සඳහන් කරන්න.
vi. ජේසුස් වහන්සේ සිදුකළ දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්ය වර්ග 2 ක් නම් කරන්න.
vii. දස පනතේ 10 වන පනතෙන් අපට ලබාදෙන උපදේශය කුමක් ද?
viii. තම ඇදහිල්ල තුළ දෙවියන් වහන්සේ වෙනුවෙන් දුක උසුලාගත් බයිබලීය චරිත 2 ක් නම් කරන්න.
ix. සහනාධාර සේවය සඳහා උපස්ථායකයන් පත්කළ හේතුව කුමක් ද?
x. රෝමයේ සිට කෙරෙන්තියට පැමිණ එහි වාසය කරද්දී පාවුල්තුමාට හමු වූ භක්තිවන්ත යුවලගේ නම් සඳහන් කරන්න.

(02) i. දේව රාජ්‍ය අන්‍ය ජාතීන්ටද විවෘතව පවතින බව තහවුරු කරමින් ජේසුස් වහන්සේ පැරණි ගිවිසුමෙන් යොදාගත් උදාහරණ 2 ක් ලියන්න.
ii. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් පුහුණුකර සුබ අස්න ප්‍රකාශ කිරීම සඳහා පිටත්කර හැරීමේ දී ලබාදුන් උපදෙස් 3 ක් හා පැවරූ කාර්යයන් 3 ක් ලියන්න.
iii. ශ්‍රාවකයන් පිටත්කර හැරීමේ දී ලබාදුන් උපදෙස් හා කාර්යභාරය මඟින් වර්තමාන දූත සේවයන්හි යෙදෙනන්නන් ලබන මඟපෙන්වීම් 5 ක් කෙටියෙන් විස්තර කරන්න.

(03) i. සද්දුසිවරුන් හා පරිසිවරුන් තම ආගමික මධ්‍යස්ථාන ලෙස පවත්වාගත් ස්ථාන 2 ක් නම් කරන්න.
ii. පලස්තීනයේ යුදෙව් ප්‍රධානීන් කණ්ඩායමක් ලෙස වැජඹුන පරිසීන් සතු වූ ලක්ෂණ 3 ක් නම් කරන්න.
iii. ජේසුස් වහන්සේ සහ පරිසිවරු අතර පැවති සංවාද තුළින් කිතුණු දිවියේ යහපැවැත්ම උදෙසා එකතුකර ගතහැකි ගුණාංග 5 ක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(04) i. ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක් වූ අවස්ථා 2 ක් සඳහන් කරන්න.
ii. දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් අපේක්ෂිත චරිත ලක්ෂණ 03 ක් ලියන්න.
iii. දේව රාජ්‍යයේ පුරවැසියෙකු ලෙස ඔබ අන් අය වෙනුවෙන් ක්‍රියාකාරන අයුරු කරුණු 5 කින් විස්තර කරන්න.

(05) i. දෙවියන් වහන්සේගේ කැඳවීමට ප්‍රතිචාර දැක්වීම සඳහා ආබ්‍රහම්තුමාට අත්හැරීමට සිදු වූ දේවල් 2 ක් සඳහන් කරන්න.
ii. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමඟ ඇතිකර ගත් ගිවිසුමෙහි ඇති තෙවැදෑරුම් පොරොන්දු මොනවාද?
iii. වත්මන් සමාජය ගුණවත් බවින් පිරුණු සමාජයක් බවට පත් කිරීමට ඊශ්‍රායෙල් ජන සමාජයෙන් ගතහැකි වටිනාකම් 5 ක් කෙටියෙන් විස්තර කරන්න.

(06) i. පාවුල්තුමා හැඳින්වීමට යෙදූ රෝම හා හෙබ්‍රෙව් නාමයන් මොනවාද?
ii. යුදෙව් භක්තිකයෙක් වූ සාවුල් කිතුණුවන් මර්දනය කිරීමට ගත් පියවර 3 ක් සඳහන් කරන්න.
iii. සිත් හැරීමෙන් පසු සාවුල්ගේ මෙහෙවර තුළින් අපට ලැබෙන ආදර්ශ 5 ක් කෙටියෙන් විස්තර කරන්න.

(07) පහත මාතෘකා අතරෙන් 2 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(ඒ ඇති අනු කොටස්වලට අදාළව කරුණු ගොනු කරන්න.)

i. දෛනික ජීවිතයට දෙව්වදන්
- දේව වචනයේ වටිනාකම
- කිතුණු ජීවිතය පෝෂණය කිරීමට මඟපෙන්වන දෙව් වදන් 2 ක්
- ස්තුතිවන්තභාවය පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම
- දෙව් වදන් අපගේ කිතුණු ජීවිත ගොඩනැංවීමට වැදගත්වන ආකාරය

ii. දේව රාජ්‍යයේ අභියෝග
- ස්ව කැමැත්තෙන් දේව රාජ්‍ය සඳහා අනුගාමී වීමට කැමැත්ත දැක්වූ පුද්ගලයාගේ ප්‍රකාශය
- ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය
- ජේසුස් වහන්සේගේ ආරාධනය තුළින් කැඳවීම කළ ආකාරය
- එම කැඳවීමට ඔහුගේ ප්‍රතිචාරය
- එයට ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය

iii. කමාව තුළින් සවිමත් ජීවිතයක්
- කමාව යනු දේව ගුණාංගයක්
- කමාව දීම හා ලැබීමේ වැදගත්කම
- ජේසුස් වහන්සේගේ ජීවිතයේ දී කමාව පිළිබඳ දුන් ආදර්ශ 2 ක්
- කමාව දානය කළ ආදර්ශවත් චරිත 2 ක්
- කමාවීමේ ගුණාංගය සමාජගත කිරීමට අපේ වගකීම

iv. යහපත් බැටළු එඬේරෙක් වෙමු.
- එඬේරෙකුගේ වගකීම
- යහපත් බැටළු එඬේරෙකු ලෙස ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථා 2 ක්
- වර්තමාන සමාජයේ එඬේරුන්ගේ ක්‍රියාකලාපය
- යහපත් එඬේරා පිළිබඳව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්
- අපට පැවරෙන එඬේර වගකීම්.

ක්‍රිස්තියානි ධර්මය
11 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

I පත්‍රය

1 - 2	11 - 1	21 - 1	31 - 2	
2 - 3	12 - 2	22 - 3	32 - 4	
3 - 4	13 - 4	23 - 4	33 - 3	
4 - 4	14 - 3	24 - 4	34 - 2	
5 - 1	15 - 1	25 - 1	35 - 4	
6 - 2	16 - 2	26 - 2	36 - 1	
7 - 4	17 - 1	27 - 4	37 - 4	
8 - 3	18 - 3	28 - 2	38 - 2	
9 - 3	19 - 3	29 - 2	39 - 4	
10 - 3	20 - 2	30 - 3	40 - 4	(1x40 = 40)

II පත්‍රය

(01) i. තිබේරියස් මුහුදු ගලීල මුහුදු/ ගෙනසෙරෙත් විල

ii. සිමියොන් සහ අන්නා

iii. ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන්
දෙවියන් වහන්සේගේ හා මිනිසුන්ගේ ද ප්‍රසාදය ලබමින්

iv. ජෙරුසෙලම් දේව මාලියට රැගෙන යාම
ටෝරාව හෙවත් යුදෙව් ව්‍යවස්ථාව ඉගෙනීමට අවස්ථාව සැලසීම.

v. ඔබ වනිතාවන් අතර ආශීර්වාද ලද්දීය.
මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියෝ

vi. සුවකිරීම් / අශුද්ධාත්ම දුරුකිරීම්/ ස්වභාව ධර්මය අභිබවා කළ ක්‍රියාකාරකම් / මරණින් මතු උත්ථාන කිරීම

vii. අසල්වැසියා සතු කිසිවකට ඇලුම් නොකරන්න.

viii. -ජෝබ් / ජෙරමියා

ix. අපෝස්තළුවරු දේශනා කිරීමේ කාර්යය අතපසු කොට සභානාධාර බෙදීමේ කටයුතුවල නිරතවීම මඟහරවා ගැනීම සඳහා

x. අකිලා / ප්‍රිස්කිලා

(02) i. එලියා දිවැසිවරයා පෝෂණය කිරීමට දෙවියන් වහන්සේ ශාරපෙත්හි වැන්දඹුව තෝරා ගැනීම.
එලියා දිවැසිවරයාගෙන් සුවය ලැබීමට නාමන් නම් අන්‍ය ජාතික ශතාධිපතිතුමා තෝරාගනු ලැබීම.

ii.

උපදෙස්	කාර්යභාරයන්
1. සේවා සඳහා ගෙන නොයා යුතුදේ. (පසම්බියක්/මල්ලක්/පාවහන්/සැරයටියක්/මිලමුදල්/කමිස දෙකක්)	රෝග සුවකිරීම
2. සුභ අස්න පිළිනොගන්නා අය සමඟ නතර නොවන්න. දූලිගසා දමා පිටත්ව යන්න.	යක්ෂයන් දුරු කරන්න.
3. සුභ අස්න පිළිගන්නා අය සමඟ නතරවන්න.	දේව රාජ්‍ය ප්‍රකාශ කරන්න.

iii.
- ශ්‍රාවකයන් පිටත්කර හැරීමේ දී ලබාදුන් උපදෙස් මඟින්
- චාම දිවිපෙවතක් හා දෙවිදුන් කෙරෙහි විශ්වාසයෙන් සේවයේ නියැලෙන්න.
- ශ්‍රාවකයන් මිල කළ නොහැකි අසීරු දෙයක් බැවින් සැලසුම් සහගතව යාච්ඤාවෙන් ගමන් කළ යුතු බව
- සුභ අස්න ප්‍රකාශ කිරීමට ප්‍රමාද නොවිය යුතුබව.
- සේවයේ දී පීඩා හා අභියෝගවලට මුහුණදීමට සිදුවන බව
- සාමූහිකව සහෝදරත්වයෙන් සේවය කිරීම තුළ සේවයේ ගුණාත්මකභාවය අත්දකිය හැකිබව.

(03) i. සද්දුසිවරු - ජෙරුසලම් දේවමාලිගාව
පරිසිවරු - සිනගෝග හෙවත් ධර්මශාලා

ii.
- යුදෙව් ව්‍යවස්ථාවේ අභ්‍යන්තර හරය පැහැර හැර බාහිර හරය ඉස්මතු කර ඒවා සෘජුලෙස පැවැත්වීම.
- හරසුන් පිළිවෙත් පිළිපැදීමට ජනතාව පීඩාකාරී ලෙස යොමු කරවීම
- ආගමික නිතිරීති දැඩිලෙස ආරක්ෂා කිරීම.
- තම ධාර්මික බව පිළිබඳව උඩඟුවීම.
- ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රසිද්ධියේ යාච්ඤා කරමින් තම වස්ත්‍රවල ශුද්ධ ලියවිලි පාඨ පවා ලියා තිබීම.
- දන් දීමේ දී හොරණෑ නාද කරමින් ප්‍රචලිත කිරීම.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

iii. සබත කඩ කිරීම හා සබත් දින සුව කිරීම් කිරීම.
- දිය උදර රෝගියා / අතක් පන නැති මිනිසාට සුවයදීම - දේව වචනය හා නීති වචනාර්ථයෙන් පමණක් නොව එහි හරයාත්මක අවබෝධයෙන් යුතුව පිළිගෙන කටයුතු කළයුතු බව.
- අත් සේදීමේ පිළිවෙත ඉටු නොකිරීම පිළිබඳ - ආගමික වත් පිළිවෙත් පමණක් ඉටුකිරීම අර්ථ විරහිතභාවය හා බාහිර පිරිසිදුකම පමණක් නොව අධ්‍යාත්මික අභ්‍යන්තර පිරිසිදුකම පිළිබඳව
- පව්කමා කිරීමේ බලය පිළිබඳ ප්‍රශ්න කළ අවස්ථාවේ - ක්‍රියාව විවේචනය කිරීමට ගත් උත්සහයේ ඵලයක් නොමැති බව. ප්‍රතික්ෂේප කළ යුත්තේ පාපය මිස පව්කරුවා නොවන බව.
- උපවාස ප්‍රශ්නයේ දී - ගතානුගතික නියමයන් වලට වහල්වී අර්ථ විරහිතව කරන වත් පිළිවෙත් වල නිසරු බව අවබෝධ කරදීම.

(04) i. හෙබ්‍රෙව් - සාවුල් , ග්‍රීක - පාවුලු

ii. • ස්තේපන්ගේ මරණයට සාක්ෂිකරුවෙක් වීම.
•ස්තේපන්ගේ මරණයට සතුට පලකිරීම.
•ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් වෙත ගොස් මරණ තර්ජන එල්ල කිරීම.
•කිතුණු ස්ත්‍රීන් හා පුරුෂයන් අල්ලා ජෙරුසෙලමට ගෙන එනු පිණිස දමස්කයේ ධර්මශාලාවට ඉදිරිපත් කිරීම සඳහා උත්තම පූජකයාගෙන් බලපත්‍ර ලබාගැනීම.

iii. •කුමන තත්ත්වයකදී වුවද අප යම් කාර්යයකට කැඳවන්නේ නම් කැඳවන්නා වූ සේවය උදෙසා කීකරුවීම.
•අපගේ පෞද්ගලික තීරණවලට වඩා දෙවිඳුන්ගේ තීරණ ක්‍රියාත්මක වන බව.
•දෙවියන් වහන්සේ තෝරා දෙන මාර්ගය දුෂ්කර වුවද ධෛර්යයෙන් යුතුව සේවයේ යෙදීම / යාච්ඤාව තුළින් දිවි ගෙවිය යුතු බව හා සේවයේ නිරත විය යුතු බව.
•පැමිණෙන අසීරුතාවලට මුහුණ දීමට ශක්තිය ශුද්ධාත්මයාණන් වහන්සේ සපයන බව.
•තමන් කැමතිව මාර්ගයේ යන්නට දෙවිඳුන් ඉඩ ප්‍රස්තාව නොදෙන බව.

(05) i. තම මව්බිම / නෑදෑයන් / පියාගේ ගෘහය

ii. •විශාල ජාතියක පියා බවට පත්වීම.
•දේශයක උරුමය ලැබීම.
•අන්‍යයන්ට ආශිර්වාදයක් වීම.

iii. •එකම දෙවිඳුන් කෙරෙහි තිබූ ඇදහිල්ල
•දෙවිඳුන් කෙරෙහි විශ්වාසය හා කීකරුකමෙන් ජීවත්වීම.
•සමාජීය සාරධර්ම ජුදා නීති හා දසපනත අනුව දිවි ගෙවීම.
•ජුදා ආගමික වත් පිළිවෙත් වලට අනුව තම දිවිපෙවෙත හැඩගස්වා ගැනීම අනුව අපතේ ආගමික වත් පිළිවෙත් වලට
•මුල්තැන දීම හා ඒවා ඉටුකිරීම. (කිතුණු ආගමික වත්පිළිවෙත්)
•දේව සබඳතාවයන් ඇත් නොවීම.

(06) i. රෝම - පාවුලස්
හෙබ්‍රෙව් - සාවුල්

ii. •ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් වෙත ගොස් මරණ තර්ජන එල්ල කිරීම.
•ගෙයින් ගෙට ගොස් ස්ත්‍රීන් හා පුරුෂයන් අල්ලා සිරභාරයට ගනිමින් සභාව විනාශ කිරීමට වෙරදැරීම.
•කිතුණු ස්ත්‍රීන් හා පූජකයාගෙන් බලපත්‍ර ලබාගැනීම.
•ස්තේපන් මරා දැමීම පිළිබඳ සතුට පල කිරීම.

iii. •දමස්කයේ කිතුණුවන් අත්අඩංගුවට ගනු ලැබූවන් සිත් හැරීමෙන් පසු දමස්කයේ ශ්‍රාවකයන් සමඟ නතරව සේවය ආරම්භ කිරීම.
•ජේසුස් වහන්සේ ගැන ධර්මශාලාවලදී දේශනා කිරීම.
•ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව ප්‍රකාශ කිරීම.
•දමස්කයේ ජුදෙව් විරෝධය මැද නිර්භීතව කටයුතු කිරීම.
•සාවුල්ට මරණ තර්ජන පැමිණීමෙන් ක්‍රිස්තුස් වහන්සේගේ මාර්ගය පහසු නොවන දුක් ගැහැට්වලින් යුක්තක් බව අවබෝධ කරගෙන ධෛර්යයෙන් යුක්තවීම.
•සේවය කිරීම සඳහා ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ විය යුතුය.
•තමන් කැමති මාවතක නොව දෙවියන් වහන්සේ තෝරාදෙන මාවත තුළ සේවයේ නියැලීමට සිදුවන බව.
•යාච්ඤාව තුළින් ජීවිතයට මුහුණදිය යුතුබව.
•විවිධ සමාජ පසුබිම් විවිධ භාෂා, ආගම් අදහන අය හමුවන අතර කිතුණුකමේ ආදර්ශයන් ඔවුන් අතර තැබිය යුතුබව.

(07) i. 10 ශ්‍රේණියේ - 123 -126 දක්වා පිටුවල ඇති කරුණු
ii. 10 ශ්‍රේණියේ - 108-116 දක්වා පිටුවල ඇති කරුණු
iii. 11 ශ්‍රේණියේ පෙළපොතේ - 24-27 දක්වා පිටුවල ඇති කරුණු
iv. 11 ශ්‍රේණියේ පෙළපොතේ - 7-10 දක්වා පිටුවල ඇති කරුණු

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank